# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## සේවකයන්ගේ ජාතික අවම වේතනය

**සේවායෝජකයන් විසින් සේවකයන්ට ජාතික අවම වේතනය ගෙවීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.**

---

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා විසින්
2016 පෙබරවාරි මස 10 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2016 ජනවාරි මස 18 වැනි දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[77 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 11.00 යි          තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

# සේවකයන්ගේ ජාතික අවම වේතනය

එල්. ඩී.-ඕ. 51/2015.

**සේවායෝජකයන් විසින් සේවකයන්ට ජාතික අවම වේතනය ගෙවීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

**1.** (1) මේ පනත 2016 අංක  දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ පනතේ විධිවිධාන සියලු කාර්ය සඳහා 2016 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය.

නිසි බලධරයා.

**2.** (1) මේ පනතේ කාර්ය සඳහා කොමසාරිස් ජනරාල්වරයා නිසි බලධරයා විය යුතු ය.

(2) මේ පනත මගින් නිසි බලධරයා වෙත පවරා ඇති හෝ පනවා ඇති හෝ වෙන්කර දී ඇති යම් බලතල, කර්තව්‍ය හෝ කාර්ය එම බලධරයා විසින් කම්කරු දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු වෙත පවරනු ලැබිය හැකි ය.

ජාතික අවම වේතනය.

**3.** (1) යම් කර්මාන්තයක හෝ සේවාවක නියුක්ත සියලුම සේවකයන් සඳහා ජාතික අවම මාසික වේතනය රුපියල් දස දහසක් විය යුතු අතර, සේවකයකුගේ ජාතික අවම දෛනික වේතනය රුපියල් හාරසියයක් විය යුතු ය.

(2) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන කවරක් වුවද, යම් කර්මාන්තයක හෝ සේවාවක සේවායෝජකයකු, තමා විසින් සේවයේ නියුක්ත කොට ඇති යම් සේවකයකුට, (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන්, අවස්ථාවෝචිත පරිදි ජාතික අවම මාසික හෝ දෛනික වේතනයට අඩු වේතනයක් ගෙවනු නොලැබිය යුතු ය.

(3) මේ පනතේ කාර්ය සඳහා, වේතනය සම්බන්ධයෙන් වන කවර ස්වභාවයක හෝ සියලු දායක මුදල් අඩු කිරීමෙන් පසු සේවකයකුගේ වේතනය, ජාතික අවම මාසික හෝ දෛනික වේතනය ලෙස සලකනු ලැබිය යුතු ය.

2—PL 009653 -475 (2016/01)

සේවා නියුක්තිය අඛණ්ඩව පැවතීම සම්බන්ධයෙන් වූ විශේෂ විධිවිධාන.

**4.** 3 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව, යම් සේවායෝජකයකු විසින් සේවයේ නියුක්ත කරනු ලැබ ඇති සෑම සේවකයකු ම, එම සේවායෝජකයාගේ සේවකයකු වශයෙන් නොකඩවා සේවය කරන තාක් කල්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි ඒ සේවකයා භුක්ති විඳිමින් සිටි කවර නාමයකින් හෝ පදවි නාමයකින් හෝ හඳුන්වනු ලබන මුදලින් කරන ලද වැටුප්, දීමනා හෝ වෙනත් ගෙවීම්වලට අදාළ නියම හා කොන්දේසිවලට නොඅඩු වාසිසහගත තත්ත්වයෙන් යුත් නියම හා කොන්දේසි මත එසේ නොකඩවා සේවයෙහි නියුක්ත කරනු ලැබිය යුතු ය.

ලේඛනයක් පවත්වා ගෙන යාම සේවායෝජකයාගේ කාර්යය බව.

**5.** (1) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයේ සිට සහ එදිනට පසු ව, යම් කර්මාන්තයක හෝ සේවාවක සේවකයකුගේ සේවායෝජකයා විසින් -

(අ) ඔහු විසින් සේවයේ නියුක්ත කරනු ලැබ ඇති එක් එක් සේවකයාගේ නම;

(ආ) ඔහු විසින් සේවයේ නියුක්ත කරනු ලැබ ඇති එක් එක් සේවකයා විසින් ඉටුකරනු ලබන වැඩයේ වර්ගය; සහ

(ඇ) වේතන වශයෙන් ඒ එක් එක් සේවකයාට ගෙවනු ලබන මුදල,

දැක්වෙන ලේඛනයක්, ඒ කර්මාන්තය හෝ සේවාව පවත්වාගෙන යනු ලබන්නේ යම් ස්ථානයක ද ඒ ස්ථානයෙහි පවත්වාගෙන තබාගෙන යා යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන සෑම ලේඛනයක් ම සේවායෝජකයා විසින් අවුරුදු හයක කාලයක් සඳහා සුරක්ෂිතව තබා ගත යුතු ය.

නිසි බලධරයාගේ බලතල.

**6.** නිසි බලධරයාට -

(අ) යම් ලේඛනයක් පරීක්ෂා කිරීමේ කාර්යය සඳහා හෝ මේ පනතේ විධිවිධාන අනුව ක්‍රියා කරනු ලැබේ යයි නිසැකව දැනගැනීමේ කාර්යය සඳහා යම් කර්මාන්තයක හෝ සේවාවක සේවකයන් සේවයෙහි නියුක්ත කරනු ලැබ ඇති යම් ස්ථානයකට දිවා හෝ රාත්‍රී කාලයේ සියලු යුක්ති සහගත වේලාවන් හි දී ඇතුළු වී එම ස්ථානය පරීක්ෂා කිරීමට;

(ආ) තමා එම ස්ථානය පරීක්ෂා කරන විට, පරීක්ෂා කිරීම සඳහා එවැනි යම් ලේඛනයක් නොමැති නම්, ඒ ලේඛනය නියමිත පසු දිනයක දී පරීක්ෂා කිරීම සඳහා ඒ ස්ථානයේ දී හෝ එම බලධරයාගේ කාර්යාලයේ දී හෝ ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට;

(ඇ) එවැනි යම් සම්පූර්ණ ලේඛනයක හෝ එහි යම් කොටසක පිටපත් ගැනීමට;

(ඈ) එම ස්ථානයේ දී තමාට දක්නට ලැබෙන්නා වූ ද, එම ස්ථානයෙහි පවත්වාගෙන යනු ලබන යම් කර්මාන්තයක හෝ සේවාවක සේවයෙහි නියුක්ත සේවකයන්ගේ සේවායෝජකයා බවට විශ්වාස කිරීමට තමාට සාධාරණ හේතු ඇත්තා වූ ද, යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීමට; හෝ

(ඉ) යම් කර්මාන්තයක හෝ සේවාවක සේවයෙහි නියුක්ත සේවකයන්ගේ යම් සේවායෝජකයකුට -

(i) එවැනි යම් සේවායෝජකයකු විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටින සියලු ම සේවකයන්ට හෝ ඒ සේවකයන්ගෙන් සමන්විත වන යම් නිශ්චිත පන්තියකට හෝ වර්ගයකට අදාළ වන්නා වූ ද, මේ පනතේ කාර්ය සඳහා තමා විසින් නියම කරනු ලබන වෙනත් යම් විස්තර ඇතුළත් වන්නා වූ ද වාර වාර්තාවක්;

(ii) එවැනි යම් සේවායෝජකයකු විසින් සපයනු ලබන යම් වාර වාර්තාවක සඳහන් විස්තර සම්බන්ධයෙන් තමා විසින් නියම කරන තොරතුරක් හෝ පැහැදිලි කිරීමක්; හෝ

(iii) එවැනි යම් සේවායෝජකයකු විසින් පවත්වාගෙන යනු ලබන යම් සම්පූර්ණ ලේඛනයක හෝ එහි යම් කොටසක සත්‍ය පිටපතක්,

නිශ්චිත දිනයක දී හෝ ඉන් පෙර තමා වෙත සපයන ලෙස ලිඛිතව විධාන කිරීමට,

බලය තිබිය යුත්තේ ය.

ලේඛනය ඉදිරිපත් කිරීමේ කාර්යය.

**7.** (1) පරීක්ෂා කිරීම සඳහා ලේඛනය ඉදිරිපත් කරන ලෙස හෝ එම ලේඛනයේ සත්‍ය පිටපතක් සපයන ලෙස හෝ ඒ ලේඛනයේ පිටපතක් ගැනීමට ඉඩ සලසන ලෙස කොමසාරිස් ජනරාල්වරයා විසින් යම් සේවායෝජකයකුට නියම කරනු ලැබූ විට, ඒ සේවායෝජකයා විසින් එය ඉටු කළ යුතු ය.

(2) යම් කර්මාන්තයක හෝ සේවාවක සේවකයකුගේ යම් සේවායෝජකයකු විසින්,

(අ) 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පවත්වාගෙන, තබාගෙන යා යුතු ලේඛනය පවත්වාගෙන තබාගෙන යාම පැහැර හැර ඇති අවස්ථාවක; හෝ

(ආ) 6 වන වගන්තිය යටතේ ඒ ලේඛනය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ විට, එසේ කිරීම පැහැර හරින අවස්ථාවක,

මේ පනත යටතේ ඒ සේවකයාට ගෙවනු ලැබිය යුතු, අවස්ථාවෝචිත පරිදි, වේතනය හෝ එහි හිඟ මුදල කොමසාරිස් ජනරාල්වරයා විසින් තමා වෙත ඇති සියලු වාචික හා ලේඛනගත සාක්ෂි මත පදනම්ව තක්සේරු කළ යුතු අතර, එවැනි යම් වේතනයක් හෝ ඉන් කොටසක් ගෙවීම පැහැර හරිනු ලබන අවස්ථාවක 8 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

ජාතික අවම වේතනය ගෙවීම පැහැර හැරීමට එරෙහි ක්‍රියාමාර්ග.

**8.** (1) යම් සේවායෝජකයකු විසින් මේ පනත යටතේ යම් සේවකයකුට හෝ සේවකයන්ට ගෙවිය යුතු ජාතික අවම මාසික හෝ දෛනික වේතනය ගෙවීම පැහැර හරින අවස්ථාවක, තමා විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි විමර්ශනයකින් පසුව ඒ සේවායෝජකයා විසින් ඒ සේවකයාට හෝ සේවකයන්ට එම ජාතික අවම මාසික හෝ දෛනික වේතනය ගෙවීම පැහැර හැර ඇති බව කොමසාරිස් ජනරාල්වරයා විසින් සෑහීමට පත්වන්නේ නම්, ඒ සේවායෝජකයා වෙත නිකුත් කරනු ලබන දැන්වීමක් මගින්, ඒ මුදල ගෙවිය යුතු වන කාලපරිච්ඡේදය වෙනුවෙන් ඒ සේවකයා හෝ සේවකයන් සම්බන්ධයෙන් ගෙවීම පැහැර හැර ඇති ජාතික අවම මාසික හෝ දෛනික වේතනයෙහි කොටස එම දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය ඇතුළත තමා වෙත තැන්පත් කරන ලෙස කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ සේවායෝජකයාට නියම කරනු ලැබිය යුතු ය.

(2) සේවායෝජකයා විසින් (1) වන උපවගන්තියේ සඳහන් දැන්වීම ලැබීමෙන් පසුව, එම දැන්වීමෙහි සඳහන් මුදල දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනයේ දී හෝ එදිනට පෙර කොමසාරිස් ජනරාල්වරයා වෙත තැන්පත් කරනු ලැබිය යුතු අතර, එම දැන්වීම ලැබීමෙන් පසුව සේවායෝජකයා විසින් අදාළ සේවකයාට හෝ සේවකයන්ට, පැහැර හරින ලද වේතනයෙහි යම් කොටසක් ගෙවීම, පැහැර හරින ලද ඒ මුදල හා සම්බන්ධ වලංගු ගෙවීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(3) යම් සේවායෝජකයකු විසින් මේ පනත යටතේ ජාතික අවම මාසික හෝ දෛනික වේතනය ලෙස ගෙවීමට යටත් වන යම් මුදලක් ගෙවීම පැහැර හැරීමෙන් (2) වන උපවගන්තිය උල්ලංඝනය කරන අවස්ථාවක, එසේ ගෙවිය යුතු වන මුදල පිළිබඳ විස්තරයක් ද ගෙවීම පැහැර හැරි සේවායෝජකයාගේ නම සහ ඔහු පදිංචි ස්ථානය පිළිබඳ විස්තරයක් ද ඇතුළත් සහතිකයක් කොමසාරිස් ජනරාල්වරයා විසින්, ගෙවීම පැහැර හැරීම සිදු ව ඇත්තේ යම් සේවකයකු හෝ සේවකයන් සම්බන්ධයෙන් ද ඒ සේවකයාගේ හෝ සේවකයන්ගේ සේවානියුක්ති ස්ථානය පිහිටි කොට්ඨාසය විෂයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයා වෙත නිකුත් කළ යුතු ය. එවිට මහේස්ත්‍රාත්වරයා විසින්, මේ පනත යටතේ ගෙවිය යුතු මුදල අයකර ගැනීම සඳහා ඒ සේවායෝජකයාට විරුද්ධව වැඩිදුර නඩු කටයුතු නොපැවැත්විය යුත්තේ මන්ද යන්නට හේතු දැක්වීමට ඔහු තමා ඉදිරිපිටට කැඳවිය යුතු ය. සේවායෝජකයා විසින්, අවස්ථාවෝචිත පරිදි, ඒ සිතාසියෙහි නිශ්චිතව සඳහන් දිනයෙහි අධිකරණය ඉදිරිපිට පැමිණ පෙනී සිටීම පැහැර හැරියහොත් හෝ ප්‍රමාණවත් හේතු පෙන්වනු නොලැබුවහොත් ඒ මුදල, බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ යුතු වරදක් සඳහා මහේස්ත්‍රාත්වරයාගේ දණ්ඩන නියමයකින් ඒ සේවායෝජකයා වෙත නියම කරන ලද දඩයක් ලෙස සැලකිය යුතු අතර, එවිට එවැනි වරදක් සඳහා නියම කරන ලද දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන (ඒ උපවගන්තියේ (අ), (ඇ) සහ (එ) ඡේදවල විධිවිධාන හැර) අදාළ විය යුතු ය. ඒ දණ්ඩන නියමය කරන වේලාවෙහි ඒ උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර මහේස්ත්‍රාත්වරයා විසින් නියම කළ හැකි යම් විධානයක් ඔහු විසින් කළ හැකි ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයක ඇති යම් ප්‍රකාශයක නිරවද්‍යතාවය, මේ වගන්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක දී අධිකරණය විසින් ප්‍රශ්න කිරීම හෝ විභාග කිරීම නොකළ යුතු අතර, ඒ අනුව ඒ සහතිකයෙහි ඇති යම් ප්‍රකාශයක්, ගෙවීම පැහැර හැරි සේවායෝජකයාගෙන් මේ පනත යටතේ අය විය යුතු මුදල යථා පරිදි ගණනය කොට ඇති බවට සහ ඒ මුදල නොගෙවා පැහැර හැර ඇති බවට ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු ය.

(5) මේ පනත යටතේ යම් සේවායෝජකයකු විසින් ගෙවිය යුතු යම් මුදලක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ ඔහුට විරුද්ධව පවත්වන යම් නඩු කටයුත්තක දී ඒ මුදල ගෙවූ බව ඔප්පු කිරීමේ භාරය සේවායෝජකයා මත වන්නේ ය.

(6) (68 වන අධිකාරය වූ) කාලාවරෝධ ආඥා පනතේ විධිවිධාන (3) වන උපවගන්තිය යටතේ ගනු ලබන යම් ක්‍රියාමාර්ගයකට අදාළ නොවිය යුතු ය.

වැරදි සහ දණ්ඩන.

**9.** (1) යම් කර්මාන්තයක හෝ සේවාවක නියුක්තව සිටින, මේ පනතේ 3 වන වගන්තියේ හෝ 4 වන වගන්තියේ හෝ 8 වන වගන්තියේ විධිවිධාන කඩකරන යම් සේවායෝජකයකු වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් විසිපන් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) (අ) 6 වන වගන්තිය යටතේ යම් ඇතුළුවීමක් හෝ පරීක්ෂා කිරීමක් සඳහා හෝ නිසි බලධරයාගේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා නිසි බලධරයාට අවශ්‍ය වන උපකාර සැපයීම පැහැර හරින;

(ආ) එම වගන්තියෙන් පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඒ බලධරයාට බාධා කරන හෝ අවහිර කරන;

(ඇ) ඒ බලධරයා විසින් තමා වෙත ඉදිරිපත් කරන ලෙස හෝ සපයන ලෙස නියම කරන යම් ලේඛනයක් ඉදිරිපත් කිරීම හෝ යම් තොරතුරක් සැපයීම ප්‍රතික්ෂේප කරන;

(ඇ) යම් ලේඛනයක යම් තොරතුරක් සම්බන්ධයෙන් සාවද්‍ය වන්නා වූ යම් ප්‍රකාශයක් කරන හෝ කරනු ලැබීමට සලස්වන නැතහොත් එම බලධරයා වෙත යම් ලේඛනයක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කරන හෝ ඉදිරිපත් කරනු ලැබීමට සලස්වන නැතහොත් දැන දැනම ඉදිරිපත් කරනු ලැබීමට ඉඩ හරින;

(ඉ) ඒ වගන්තියෙන් පවරනු ලැබූ බලතල යටතේ ක්‍රියාකරන එම බලධරයාට යම් තොරතුරක් එය සාවද්‍ය බව දැන දැනම සපයන; හෝ

(ඊ) 6 වන වගන්තිය යටතේ එම බලධරයා විසින් දෙන ලද යම් විධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරින හෝ ඒ වගන්තිය යටතේ වාර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබූ විට යම් සාවද්‍ය ප්‍රකාශයක් ඇතුළත් වාර වාර්තාවක් දැන දැනම ඉදිරිපත් කරන හෝ සපයන හෝ ඉදිරිපත් කිරීමට හෝ සැපයීමට සලස්වනු ලබන,

යම් තැනැත්තකු, වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් විසිපන් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලබන වැරදි සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ සහ ඇතැම් නිලධරයන්ගේ වගකීම.

**10.** මේ පනත යටතේ වූ යම් වරදක් යම් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරන ලද අවස්ථාවක -

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත මණ්ඩලයක් නම්, ඒ වරද සිදු කරන ලද අවස්ථාවේ දී ඒ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකුව, සාමාන්‍යාධිකාරීවරයකුව, අනුයෝජිතයකුව, ලේකම්වරයකුව සිටි හෝ ඊට සමාන නිලයක් දරමින් සිටි සෑම තැනැත්තකු ම;

(ආ) ඒ පුද්ගල මණ්ඩලය, හවුල් ව්‍යාපාරයක් නම් ඒ හවුල් ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකු ම; හෝ

(ඇ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත මණ්ඩලයක් නොවේ නම්, ඒ වරද සිදු කරන ලද අවස්ථාවේ දී ඒ මණ්ඩලයේ සාමාජිකයකුව සිටි සෑම තැනැත්තකු ම,

ඒ වරද තමාගේ කැමැත්ත හෝ අනුදැනුම නොමැතිව සිදුකරන ලද බව සහ තම කාර්යයන් හා අදාළ අවස්ථානුගත තත්වයන් පිළිබඳව සලකා බලන කල ඒ වරද සිදුකිරීම වළක්වනු පිණිස ගත යුතුව තිබූ සියලු පියවර නිසි උද්යෝගයෙන් තමා විසින් ගනු ලැබූ බව ඔහු විසින් ඔප්පු කරන්නේ නම් මිස, ඒ වරද සම්බන්ධයෙන් වරදකරුවකු ලෙස සලකනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ වන වැරදි සම්බන්ධයෙන් නඩු පැවරීමට අදාළ කොන්දේසි.

**11.** මේ පනත යටතේ සිදු කරන ලද යම් වරදක් සම්බන්ධයෙන් කිසිදු නඩු පැවරීමක් කොමසාරිස් ජනරාල්වරයා විසින් මිස හෝ කොමසාරිස් ජනරාල්වරයාගේ පූර්ව ලිඛිත අවසරය ඇතිව මිස ආරම්භ කරනු නොලැබිය යුතුය.

පනත අර්ථ නිරූපණය කිරීම.

**12.** මේ පනතේ විධිවිධාන, වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අමතරව විය යුතු අතර, මේ පනතේ විධිවිධාන මගින් ඒ නීතියෙහි විධිවිධානවල බලය හීන කිරීමක් සිදු නොවිය යුතු ය:

එසේ වුවද, මේ පනතේ විධිවිධාන සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන අතර පරස්පරතාවක් හෝ අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

අතීතයට බලපෑම.

**13.** මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී, මේ පනතේ 3 වන වගන්තිය යටතේ 2016 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන හා මේ පනත ක්‍රියාත්මක වන දිනයෙන් අවසන් වන කාලපරිච්ඡේදය සඳහා යම් සේවායෝජකයකු විසින් යම් සේවකයකුට ගෙවිය යුතු ජාතික අවම මාසික හෝ දෛනික වේතනයෙන් යම් මුදලක් නොගෙවා ඇති අවස්ථාවක හා ඒ හිඟ මුදල ඒ සේවායෝජකයා විසින් මේ පනත ක්‍රියාත්මක වන දිනයේ සිට මාස හයක කාලසීමාවක් තුළ සමාන මාසික වාරිකවලින් හෝ ඊට ඉහළ මාසික වාරිකවලින් ඒ සේවකයාට ගෙවනු ලබන අවස්ථාවක, ඒ සේවායෝජකයා සියලු කාර්යයන් සඳහා මේ පනතේ 3 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

**14.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි - අර්ථ නිරූපණය.

"කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන්, තත්කාලයෙහි කම්කරු කොමසාරිස් ජනරාල් ධුරය දරන තැනැත්තා අදහස් වන අතර, ඊට තත්කාලයෙහි අතිරේක කොමසාරිස් ජනරාල්වරයකු, කම්කරු කොමසාරිස්වරයකු, නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරයකු, සහකාර කම්කරු කොමසාරිස්වරයකු හෝ කම්කරු නිලධරයකු ලෙස ධුර දරන යම් තැනැත්තකු ද ඇතුළත් වේ;

"සේවායෝජකයා'' යන්නෙන්, තමා විසින් ම යම් සේවකයකු සේවයෙහි යොදවන්නා වූ යම් තැනැත්තකු හෝ තමා වෙනුවෙන් අන් තැනැත්තකු මගින් යම් සේවකයකු සේවයෙහි යොදවන්නා වූ යම් තැනැත්තකු අදහස් වන අතර, ඊට (හවුල් ව්‍යාපාරයක්, සමාගමක්, පළාත් පාලන ආයතනයක් හෝ වෘත්තීය සමිතියක් වන හෝ නොවන) සේවායෝජක මණ්ඩලයක් ද වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් යම් සේවකයකු සේවයෙහි යොදවන්නා වූ යම් තැනැත්තකු ද, යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරා දී ඇති වෙළඳ ව්‍යවසායක නිසි බලධරයකු ද, යම් සමාගමක නීතිමය උරුමකරු, නෛතික අනුප්‍රාප්තිකයා, පොල්මෑක්කරු හෝ අද්මිනිස්ත්‍රාසිකරු සහ ඇවරකරු ද, සංස්ථාගත නොකරන ලද මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට ඒ මණ්ඩලයේ සභාපතිවරයා හෝ ලේකම්වරයා ද සහ හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට කළමනාකාර හවුල්කරු හෝ කළමනාකරු ද ඇතුළත් වේ.

"කර්මාන්තය හෝ සේවාව" යන්නට-

(අ) යම් වෙළඳාමක්, වෙළඳ ව්‍යාපාරයක්, නිෂ්පාදනය කිරීමක් සහ කෘෂිකර්මාන්තයක් ද, වෙළඳාමක්, වෙළඳ ව්‍යාපාරයක්, නිෂ්පාදනය කිරීමක් හෝ කෘෂිකර්මාන්තයක් වශයෙන් වන යම් ව්‍යවසායක් හෝ රක්ෂාවක් ද වෙළඳාමක, වෙළඳ ව්‍යාපාරයක, නිෂ්පාදනය කිරීමක හෝ කෘෂිකර්මාන්තයක යම් ශාඛාවක් හෝ කොටසක් ද;

(ආ) පළාත් පාලන ආයතනයක සේවයේ යෙදී සිටින හෝ වෙළඳාම පිණිස වූ හෝ වෙනත් ආකාරයක ව්‍යවසායක් කර ගෙන යාම සඳහා යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ පිහිටුවනු ලැබූ යම් සංස්ථාවක සේවයේ යෙදී සිටින තැනැත්තන් විසින් ඉටු කරනු ලබන කවර හෝ ආකාරයක සේවයක්, වැඩක් හෝ ශ්‍රමය සැපයීමක් ද,

(ඇ) සේවකයන්ගේ සෑම රක්ෂාවක්, ජීවනෝපායක් හෝ සේවයක් ද; සහ

(ඈ) සේවායෝජකයන්ගේ සෑම ව්‍යවසායක් ද,

ඇතුළත් වන නමුත් ඊට යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ පිහිටුවා ඇත්තා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද, කොටස් ප්‍රාග්ධනයෙහි බහුතරය, රජය විසින් ප්‍රදානයක්, ණයක් හෝ අන්‍යාකාරයකින් සම්පූර්ණයෙන්ම හෝ කොටසක් ලෙස සපයනු ලබන අරමුදල්වලින් හෝ ප්‍රාග්ධනයෙන් සමන්විත වන්නා වූ ද යම් සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් විසින් පවත්වාගෙන යනු ලබන යම් කර්මාන්තයක්, වෙළඳ ව්‍යාපාරයක් හෝ ව්‍යවසායක් හෝ ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ අර්ථානුකූලව යම් ලියාපදිංචි කළ සමිතියක් හෝ යම් ආගමික ආයතනයක් හෝ 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ අර්ථානුකූලව යම් පුණ්‍ය ආයතනයක් ඇතුළත් නොවේ;

"ජාතික අවම වේතනය" යන්නෙන් -

(අ) සේවකයාගේ ගිවිසගත් වේතනය හෝ වැටුප නැතහොත්, සේවකයා අයත්වන කර්මාන්තය හෝ සේවාව සඳහා (136 වන අධිකාරය වූ) පඩිපාලක සභා අඥාපනත යටතේ නියම කර ඇති වේතනය; සහ

(ආ) ජීවන වියදම් දීමනාව, විශේෂ ජීවන දීමනාව හෝ ඊට සමාන වෙනත් යම් දීමනාවක් ද ඇතුළුව වේතන හෝ මූලික වැටුප,

අදහස් වේ;

"සේවකයා" යන්නෙන්, සේවායෝජකයකු සමග ප්‍රකාශිත හෝ ගම්‍යමාන නැතහොත් වාචික හෝ ලිඛිත ගිවිසුමක් වන්නා වූ ද සහ සේවා ගිවිසුමක් වන්නා වූ හෝ ආධුනිකත්ව ගිවිසුමක් වන්නා වූ හෝ පුද්ගලිකව යම් වැඩක් කර දීම පිණිස හෝ පුද්ගලිකව ශ්‍රමය සැපයීම පිණිස වූ ගිවිසුමක් වන්නා වූ ද යම් ගිවිසුමකට ඇතුළත්ව සිටින හෝ එබඳු ගිවිසුමක් යටතේ කිනම් ආකාරයක හෝ වැඩක යෙදී සිටින යම් තැනැත්තකු අදහස් වන අතර, ඊට එබඳු ගිවිසුමක් යටතේ සාමාන්‍යයෙන් සේවයෙහි නියුක්ත කොට ඇති, යම් නිශ්චිත අවස්ථාවක සේවයේ යෙදී සිටින හෝ නොසිටින යම් තැනැත්තකු සහ සේවය අවසන් කරනු ලැබ සිටින යම් තැනැත්තකු ඇතුළත් වන නමුදු, ගෘහ සේවකයකු ඊට ඇතුළත් නොවේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**15.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.